## ඉදිරියට යන කුහකවත

කපිල පීරිස් මහතා නැවතත් නම නොකියා මට ප්‍රතිචාර දැක්වීමට පටන්ගෙන ඇත. ඔහු සැප්තැම්බර් 11 වැනි දා ලිපියෙන් මෙසේ කීවේ ය. “ අපේ ඉංජිනේරු සම්ප්‍රදාය ලිපිවලට මිස ඊට අමතර මෙවැනි කෙටි සටහනක් (පිටුවකින් හරි අඩක් පමණ වූ ඊනියා කෙටි සටහනක්) සඳහා වුව විද්‍යුසරෙහි ඉඩක් වෙන් කරවා ගැනීමේ අපහසුතාවක් මතු වී තිබේ. ඒ අනුව එම ප්‍රතිචාර ඉදිරියේ දී පළ වන ඉංජිනේරු සම්ප්‍රදාය ලිපි තුළ ම ඇතුළත් වනු ඇත. එම ලිපි ද සතිපතා පළ කෙරුමට ඉඩ ප්‍රස්තා නැති වුව හොත් ඒවා යම් කාලයක් තුළ ඉවසීමෙන් කියවා අප කීමට උත්සාහ ගන්නා දේ සහ නලින් ද සිල්වා මහතා ඒවා සිතාමතා ම විකෘති කිරීමට ගන්නා අයුරු තේරුම් ගන්නා ලෙස පාඨකයන්නේ ඉල්ලා සිටිමු.” සැප්තැම්බර් මස 11 වැනි දා එසේ කී කපිල පීරිස් මහතා 18 වැනි දා ම ඔහුගේ ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය ගැන පිටු එකහමාරකට ආසන්න ලිපියක් පළ කරයි. ඒ ලිපියෙහි මගේ නම සඳහන් නොකර ඊනියා ප්‍රතිචාර දක්වයි.

කපිල පීරිස් මහතා මගේ නම සඳහන් කළ ද නො කළ ද අපේ ප්‍රවාද, නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය විවේචනය කරන හා සිංහල බෞද්ධ සම්ප්‍රදායෙහි දැනුම නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියට විරුද්ධව ලියන නිව්ටෝනීය ආධිපත්‍යය තව තවත් තහවුරු කරමින් ලියන ලිපි පළ කරනතාක් හා විද්‍යුසර කතුතුමා මට බාධා නොකරනතාක් කපිල පීරිස් මහතාගේ කුහක දුෂ්ට වෛරී චේතනා හෙළිදරව් කරන ලිපි ලියමි. එතෙක් අපේ ප්‍රවාද ලිපි පෙළ ලිවීමට නොහැකි වීම පිළිබඳ පාඨකයෝ හා කතුතුමා කමාකරත්වා! කපිල පීරිස් මහතා දහඅටවැනි දා තම ලිපිය ආරම්භයේ ම මෙසේ කියයි. “අපේ ඉංජිනේරු සම්ප්‍රදාය පිළිබඳ ව යම් ආකාරයක විමසුමක් කරමින් ලියාගෙන ගිය ලිපි පෙළ අතරමග අපේ ඉංජිනේරු සම්ප්‍රදාය පිළිබඳ ව සහ එහි දී අප අදාළ අවස්ථාවල දී නිව්ටන් නියම යොදා ගැනීම පිළිබඳ ව වන මේ ලිපිය(?) ලිවීමට සිදු වුයේ ඒ පිළිබඳ එල්ල වූ ප්‍රහාර සහ විකෘති කිරීම් නිසා ඇතැම් දෙනා සුළුවෙන් හෝ නොමග යා හැකි බැවිනි.” මේ පට්ටපල් බොරුවකි. මා ඔහුගේ ලිපි විකෘත කළ බවට ඔහු කිසිම සාක්ෂියක් ඉදිරිපත් නොකරයි. අනෙක් අතට මට ඔහුගේ ඊනියා ඉංජිනේරු සම්ප්‍රදාය පිළිබඳ ලිපිවලට ප්‍රතිචාර දැක්වීමට සිදුවුයේ ඔහු ඉහත සඳහන් ආකාරයේ ලිපි පළ කළ බැවිනි.

කපිල පීරිස් මහතාගේ කිසිදු ලිපියක් මම විකෘත නො කෙළෙමි. බොහෝ විට මා ප්‍රතිචාර දැක්වුයේ මහුගේ ලිපිවලින් උධෘත ඉදිරිපත් කරමිනි. අද වන තුරු ද කපිල පීරිස් මහතා ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදායක් ඉදිරිපත් කර නැත. අපේ ඉංජිනේරු සම්ප්‍රදාය නමින් ඔහු ඉදිරිපත් කරන්නේ අපේ ජීවන සම්ප්‍රදාය ය. ඔහ අපේ ඉංජිනේරු සම්ප්‍රදාය යන්න අතරට (සංවර්ධන) යන්න යෙදීමට පටන් ගත්තේ අපේ ජීවන සම්ප්‍රදාය හැරෙන්නට ලිවීමට වෙනත් දෙයක් නොතිබූ බැවිනි. මේ ජීවන සම්ප්‍රදාය ගැන අප ඇතුළු පිරිසක් කතාකර ඇත්තේ අසූවේ දශකයේ සිට ය. එමෙන් ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අංග අපි දැන් කලක සිට සාකච්ඡා කරන්නෙමු. කපිල පීරිස් මහතා ඒ සාකච්ඡාවලින් පළ වූ අදහස් ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදායක් නමින් නැවත නැවත කියවනවා හැරෙන්නට වෙනත් කිසිවක් නො කරයි. ඔහු පසුගිය දහඅටවැනි දා මෙසේ ලියා ඇත. “මේ ඉංජිනේරු (සංවර්ධන) සම්ප්‍රදාය නූතන බටහිර ඉංජිනේරු සම්ප්‍රදායට වඩා වෙනස් ය. පංචේන්ද්‍රිය පිනවීම වෙනුවට පංචේන්ද්‍රිය පිනවීමට අප යොමු කරන මනස පිළිබඳව විමසීමට අපේ සංස්කෘතිය තුළ අප යොමු කෙරී ඇත.” චක්‍රීයත්වය ගැන සඳහන් කරන කපිල පීරිස් මහතා ඒ දැනගැනීමට නිව්ටන් නියම අවශ්‍ය නොවේ යැයි කියයි. එපමණක් නොව අපරිමෑස්ම, නම්‍යශීලීත්වය, සතා සර්පයා ගහකොළ සමග පැවැත්වූ සහජීවනය, නිවිහැනහිල්ලේ ජීවත්වීම ආදිය ගැන දැනගැනීමට ද නිව්ටන් අවශ්‍ය නො වෙයි. ඒ ගුණ නිව්ටන් නියමවලින් දැනගත්තේ යැයි කපිල පීරිස් මහතා කියන්නේ වංචනික සිතකිනි.

ඔහු නැවත නැවත කියන මිරිසවැටිය කඩාවැටුණේ අපේ ඉංජිනේරු සම්ප්‍රදායක් ඒ එන් එස්. කුලසිංහ මහතා ඇතුළු ඉංජිනේරුවන් නොදැන සිටිය ද ඒ නිසා නොවේ. ඒ අවස්ථාවේ දී අප කලින් කියා ඇති පරිදි කපිල පීරිස් මහතාගේ ඇගයීමට ලක්වන ඩී එල් ඕ මැන්දිස් මහතා ගත්තේ ද කුලසිංහ මහතාගේ පැත්ත ය. “මිරිසවැටිය කඩාවැටුණේ (බටහිර) ඉංජිනේරු සම්ප්‍රදායේ වරදින් මිස නිව්ටන්ගේ වරදින් නොවේ” යැයි කපිල පීරිස් මහතා කියයි. එසේ නම් රුවන්වැලිසෑය ථූපාරාමය ආදී තවත් දාගැබ් රාශියක් කඩා නොවැටුණේ (බටහිර) ඉංජිනේරු සම්ප්‍රදාය නිවැරදි වූ බැවින් ද? මිරිසවැටිය පමණක් නොව ඇතැම් පාලම් ද කඩා වැටෙයි. එසේ කඩාවැටෙන්නේ කොන්ත්‍රාත්කරුවන්ගේ හෝ

© Prof. Nalin De Silva

වෙනත් අයකුගේ හෝ වෙනත් යමක හෝ වරද නිසා ය. කපිල පීරිස් මහතා මිරිසවැටිය පිළිබඳ එක් විශේෂ (particular) නිදර්ශනයක් ගෙන ඉන් සාධාරණ (general) නිගමනයක් ලබාගැනීමට උත්සාහ කරයි. එය බටහිර හෝ අපේ හෝ සම්ප්‍රදායකට එකඟ නැත.

ඒ කෙසේ වෙතත් කපිල පීරිස් මහතා නිව්ටන් බටහිර ඉංජිනේරු සම්ප්‍රදායෙන් වෙන් කරන්නේ කෙසේ ද? බටහිර සිවිල් ඉංජිනේරු සම්ප්‍රදාය නිව්ටන් මත යැපෙයි. යාන්ත්‍රික ඉංජිනේරු සම්ප්‍රදාය තාපගතික සුසමාදර්ශයෙහි මෙන් ම නිව්ටෝනීය සුසමාදර්ශයෙහි ද පදනම් වෙයි. විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු සම්ප්‍රදාය අයින්ස්ටයින්ගේ හා ක්වොන්ටම් සුසමාදර්ශවල සුළුවෙන් ද වැඩිවශයෙන් නිව්ටෝනීය සුසමාදර්ශයෙහි ද යැපෙයි. බටහිර අනෙක් ඉංජිනේරු සම්ප්‍රදාය ගත්කල ද ඉතා වැඩි වශයෙන් නිව්ටෝනීය සුසමාදර්ශයෙහි පදනම් වෙයි. කපිල පීරිස් මහතාට බටහිර ඉංජිනේරු සම්ප්‍රදාය නිව්ටන්ගෙන් හලවා ගත නො හැකි ය. නිව්ටන් නොමැතිව බටහිර ඉංජිනේරු සම්ප්‍රදායක් නැත.

“යම් යම් අයට කෙසේ වුව ද අප දැන් නිව්ටන් නියම අපේ කරගෙන ඇත.” මේ කපිල පීරිස් මහතාගේ කියමනකි. මෙහි යම් යම් අය යනුවෙන් හැඳින්වෙන්නන්ට මා ද අයත්වන බව පැහැදිලි ය. නිව්ටන්ගේ නියම අපේ කරගත්තේ කෙසේ දැයි පෙන්වීම පසුවට කල් නොදමා වහාම කළ යුතු ය. අවස්ථිති රාමුව පිළිබඳ ගැටළුවක් තමාට නැතැයි ද එයට තමාට වෙනත් විග්‍රහයක් ඇතැයි ද කපිල පීරිස් මහතා ඒ සමඟ කියයි. මේ විග්‍රහය කුමක් ද? $P = mf$ සමීකරණය $P - mf = 0$ යනුවෙන් ලිවීමෙන් ඒ ගැටළුව නො විසඳෙයි. එවිට ප්‍රශ්නය වනුයේ $P - mf = 0$ යනුවෙන් ලිවිය හැකි රාමු ඇත් ද යන්න ය. ලග්‍රාන්ජේ සමීකරණ වුව ද ලිවිය හැක්කේ ඩලම්බෙයාර් මූල ධර්මය උපකල්පනය කිරීමෙන් ලැබෙන සමීකරණයක් ආධාරයෙනි. ඒ $P - mf = 0$ වර්ගයේ සමීකරණයකි. අවසානයේ දී අයින්ස්ටයින් තම සාධාරණ සාපේක්ෂතාවාදී සමීකරණ ලීවේ ද අවස්ථිති බලයක් ලෙස නිව්ටන් සැලකූ ගුරුත්වාකර්ෂණ බලය නැති කිරීමට ය. එහෙත් එය ද ස්ථානීය (locally) වශයෙනි. අවස්ථිති රාමු නැති වුවත් අවස්ථිතිය වෙනත් ආකාරවලින් නැවතත් සමීකරණවලට රිංගයි. මේ සමීකරණවල m යනු අවස්ථිති ස්කන්ධය වෙයි. ඒ අවස්ථිතිය ඇතිවන්නේ කෙසේ ද? කපිල පීරිස් මහතාට මේ ප්‍රශ්නවලට පිළිතුරු නැත්තේ ඔහු ඉගෙන ගත් ඉංජිනේරු පීඨයේ එවැනි ප්‍රශ්න සාකච්ඡා නොකරන බැවින් හා ඒ පිළිබඳ තනියම කියවා අවබෝධයක් ලබාගැනීමට ඒ මහතා අසමත් බැවිනි.

කපිල පීරිස් මහතාට අනුව ඉංජිනේරු සම්ප්‍රදායෙහි හැර වෙනත් ක්ෂෙත්‍රයක බටහිර ප්‍රවාද යොදා ගැනීම වැරදි ය. ඔහු 18 වැනි දා ලිපියෙහි මෙසේ සඳහන් කරයි. “කෙම් පහන් ආදියෙන් අදත් බොහෝ දෙනා වැඩ ගනිති. එසේ වැඩ ගන්නේ එවා බටහිර විද්‍යාව මගින් විස්තර කෙරුමෙන් නො වේ. එසේ කිරීමට උත්සාහ ගැනුම ද විශාල විනාශයකි. එය අපේ දැනුම බටහිරයනට සංවේදී කිරීමකි. ඔවුන් එම දැනුම ද ඔවුන්ගේ රාමු තුළ ලෝකය විනාශ කරන දෑ සඳහා යොදා ගන්නවා ඇත. (අපේ සංස්කෘති නැති කෙරුම ඇතුළු) කසාය වට්ටෝරු බටහිර රසායනික විශ්ලේෂණවලට ලක් කර බෙහෙත් පෙති නිමැවීම මේ සඳහා උදාහරණයකි.” ඒ එසේ නම් ඉංජිනේරු ශිල්පයෙහි පමණක් බටහිර දැනුමෙන් අපේ ඊනියා ඉංජිනේරු සම්ප්‍රදාය තේරුම් ගැනීමට කපිල පීරිස් මහතා උත්සාහ ගන්නේ කෙසේ ද? බටහිර ඉංජිනේරු සම්ප්‍රදාය පමණක් අනෙක් බටහිර විද්‍යාවන්ගෙන් හා තාක්ෂණවලින් ඉවත්කිරීමට ඇති විශේෂත්වය කුමක් ද?

කපිල පීරිස් මහතාට තමා කරන දෙයෙහි වරදක් ඇති බව දැනෙයි. එහෙත් ඔහු ඒ පිළිගැනීමට සූදානම් නැත. ඔහු දඩබ්බර ව තම සාවද්‍ය මතයෙහි ම එල්බගෙන සිටියි. ඔහුගේ 18 වැනි දා ලිපියේ මේ ප්‍රකාශ විමසා බලමු. “තව ලෙසකින් කියන්නේ නම් මෙහි දී සිදු කෙරෙන්නේ අපේ ඉංජිනේරු සම්ප්‍රදාය ඉස්මතු වන පරිදි අදාළ කොටස් (ආවරණ) නිව්ටන් නියම මගින් ප්‍රතිනිර්මාණය කෙරුමකි. එහෙත් කසාය වට්ටෝරුවක් බටහිර රසායන විද්‍යාවෙන් පැහැදිලි කෙරුමේ දී අදාළ සම්ප්‍රදාය පිළිබඳ ගැටලුවක් පමණක් නොව රසායන විද්‍යාවෙන් කෙතෙක් දුරට එය පැහැදිලි කළ හැකි ද යන්න බරපතළ ගැටලුවකි.” කපිල පීරිස් මහතා නොදන්නවාට යම් ප්‍රමාණයකට කසාය වට්ටෝරුවෙන් ලෙඩ සුව වන්නේ කෙසේ ද යන්න බටහිර රසායන විද්‍යාව ඇසුරෙන් තේරුම් ගත හැකි ය. බටහිර විද්‍යාවන්ට අපේ වට්ටෝරු යම් ප්‍රමාණයකට විශ්ලේෂණය කළ හැකි ය. ඔවුන්ට කළ නොහැක්කේ එහි ඇති සංස්ලේෂණය ය. අපේ පැරණි ඉංජිනේරු ශිල්පයෙහි ඇති ඇතැම් දෑ බටහිර විද්‍යාවට යම් ප්‍රමාණයකට විශ්ලේෂණය කළ හැකි ය. කපිල පීරිස් මහතා වැන්නවුන් කරන්නේ එයයි. ඉන් අපේ ඊනියා ඉංජිනේරු සම්ප්‍රදායක් නො ලැබෙයි.

© Prof. Nalin De Silva

අපේ ඉංජිනේරු සම්ප්‍රදායේ සංස්ලේෂණය බටහිර විද්‍යාවට හසු නො වෙයි. බිසෝ කොටුවේ සමස්තය නිව්ටන් නියමවලින් තේරුම් ගත නො හැකි ය.

කපිල පීරිස් මහතාගේ හිතළුවක් මෙසේ ය. “ඉතින් අප බිසෝකොටුවේ අපේ ඉංජිනේරු සම්ප්‍රදාය මතු කර ලීම වුව එය බටහිරයන්ට අත්වැලක් විය නොහැකි දැයි දැන් කෙනකුට සිතෙන්නට බැරි නැත. එය අත්වැලක් විය හැකි ය. එම අත්වැල ඔස්සේ ද ඔවුන් ද අපේ සංවර්ධන රාමුවට පිවිසෙන්නේ නම් කදිම ය. එහෙත් ඔවුන් අපේ අපේ සංවර්ධන රාමුව ගැනීම වෙනුවට මේ ඔස්සේ අපේ සම්ප්‍රදා දැනගෙන ඒවාට පහර දීමට එය යොදා නොගනීවි දැයි දැන් තවත් අයකුට සිතීමට බැරි නැත. එය ද එසේ විය හැකි ය. .. .. .. එහෙත් අපට ඉන් වන යහපත පෙර කී හානියට වඩා අති විශාල වනු ඇත.” මේ හිතළුවකට වැඩි දෙයක් නො වේ. එසේ සිතීමට කපිල පීරිස් මහතාට ඇති සාධක කවරේ ද?

අද ආයුර්වේද වෛද්‍යවරු ආයුර්වේද හා සිංහල බෙහෙත් බටහිර රසායන විද්‍යාවෙන් විශ්ලේෂණය කර ආචාර්ය උපාධි ලබාගනිති. එමගින් ඔවුහු සමාජයේ පිළිගැනීමක් ද ලබති. ඒ අතර අපේ බෙහෙත් බටහිර ආධිපත්‍යයට යටකරති. කපිල පීරිස් මහතා කරන්නේ ද එයයි. ඔහු බටහිර ඉංජිනේරුවිද්‍යා සම්මේලනවලට පත්‍රිකා ලියයි. එමඟින් පිළිගැනීමක් ලබාගනියි. ඒ අතර නිව්ටන්ගේ ආධිපත්‍යය තහවුරු කරයි. කපිල පීරිස් මහතාට තවමත් ඒ බව නොතේරේ නම් එයට බෙහෙත් නැත.

නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය ගැන කපිල පීරිස් මහතාට ඇත්තේ දැඩි වෛරයකි. ඒ දැන් ඉවර යැයි ඔහු කියයි. ඔහු උදයසිරි වික්‍රමරත්නගේ හා ඔහුගේ අනෙක් මිතුරන්ගේ ගණයේම දාර්ශනිකයෙකි. බෞද්ධයෙකි. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය යනු අප කලින් ද කී පරිදි දැනුම ලබාගැනීම පිළිබඳ ප්‍රවාදයක් මිස නිවන් දැකීම පිළිබඳ ප්‍රවාදයක් නො වේ. ඒ සිංහල බෞද්ධ චින්තනයෙහි පදනම් වී ඥානවිභාගය පිළිබඳ නිර්මාණය කෙරුණු ප්‍රවාදයක් මිස බුද්ධාගමට විකල්පයක් නො වේ. නිර්මාණාත්මක සාපේක්ෂතාව ද යම් දවසක ඉවර වනු ඇත. ඒ කපිල පිරිස් මහතා හා ඔහුගේ මිතුරන් බලාපොරොත්තු වන පරිදි අද නො වේ. සිංහල බෞද්ධ චින්තනය මත පදනම් ව ඥාන විභාගය පිළිබඳ වඩා සාර්ථක සංගත ප්‍රවාදයක් ගොඩනැගුණු විට එහි ආයු කාලය ක්ෂය වනු ඇත. කපිල පීරිස් මහතා බුදුමගක් ගැන කියමින් නිව්ටන්ගේ ආධිපත්‍යය තහවුරු කරමින් රාග ද්වේෂ මෝහ මුල් කරගත් ලිපි ලියමින් නිවන් දැකිය හැකි යැයි සිතන්නේ ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva